- THE SINHALA -



# නංගී

නංගී මගේ නුඹ ඉපදුන දිනේ පටන්
බැඳි සෙනෙහස වැඩුනි සඳ මෝරන විලසින්
පෙර අත් බවයකදී මා හා බැඳුනෙ සෙනින්
නුඹ අද මවක් වේ පිරිපුන් කුලුණු සිතින්

නුඹ ගැයූ සිඟිති ගී නිති සිහියට එනවා
මා සිත සැනින් නුඹ වෙත ඉගිලී යනවා
එක මව් කුස සිටිය සුවඳින් පිබිදෙනවා
ඒ පින උරුම වූ මා අද සැනසෙනවා

රටකින් රටක සිටියත් අද අපි වෙන්වී
නැත තනි වූ සිතක් උරුමෙන් අප සතුවී
බාධක කම් කටොලු බිඳ සතුටින් බරවී
ජය බිම කරා යන දින නුඹ නැත පසුවී

නුඹ හිමි දූ පුතුන් යහතින් වැජඹේවා!
නුඹෙ කරුණා ගඟට මා බිඳුවක් වේවා!
තෙරුවන් බලෙන් නුඹ සැම දෙවි රැකදේවා!
හැම බවයකම නුඹ මගෙ නංගිම වේවා!

**ආචාර්ය පෙල්ටන් පීරිස්**

---

THE SINHALA - SEPTEMBER 2012
Published by The Sinhalese Cultural Forum of NSW
ISSN 1834-7061